# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2261/49 - 2022 ජනවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී- 3/2013(ii)

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 139 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 321 වන වගන්තිය යටතේ වරාය හා නාවික අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**රෝහිත අබේගුණවර්ධන,**
වරාය හා නාවික අමාත්‍ය,

2021 දෙසැම්බර් මස 29 දින,
කොළඹ දී ය.

**නියෝග**

1. (1) මේ නියෝග 2021 අංක 01 දරන වෙළඳ නැව් (සමීක්ෂණ සහ සහතික) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ I වන පරිච්ඡේදය සහ 1988 ප්‍රොටොකෝලය බලාත්මක කිරීම මෙම නියෝගවල කාර්යය විය යුතු ය.


1A - G 35888 — 510 (2022/01)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I වන කොටස

### මෙම නියෝගවල අදාළත්වය

2\. (1) මේ නියෝගයේ (2) වන සහ (3) වන උප නියෝගවල විධිවිධානවලට යටත්ව, මේ නියෝග, ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ඇති සහ ජාත්‍යන්තර මුහුදු ගමන්වල නිරතවන නැව්වලට සහ ශ්‍රී ලංකා ජල තීරයේ ඇති වෙනත් යම් විදේශීය නැව් වලට අදාළ විය යුතු ය.

(2) (මේ නියෝගවල "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1974 මුහුදේ දී ජීවිතාරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ සහ 1988 ප්‍රොටොකෝලයේ අන්‍යාකාරයෙන් ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා ඇත්තේ නම් මිස, මේ නියෝගඃ

(අ) යුද නැව් සහ සෙබළ නැව් වලට;
(ආ) දළ ටොන් බර 500ට අඩු භාණ්ඩ නැව් වලට;
(ඇ) යාන්ත්‍රික ක්‍රම මගින් ප්‍රචලනය නොකරනු ලබන නැව් වලට;
(ඈ) ආදි කාලයේ සාදන ලද ලීයෙන් තැනූ නැව්වලට;
(ඉ) වාණිජ කටයුතුවල නොයෙදෙන විනෝද යාත්‍රාවලට; සහ
(ඊ) ධීවර යාත්‍රාවලට,

අදාළ නොවිය යුතු ය.

(3) සම්මුතියේ V වන පරිච්ඡේදයේ ප්‍රකාශිතව ම විධිවිධාන සලස්වා ඇති පරිදි මිස, මේ නියෝගවල විධිවිධාන, උතුරු ඇමරිකාවේ මහා විල් වෙත සහ කැප් ඩෙස් රොසියර්ස් සිට ඇන්ටිකොස්ටි දූපතේ බටහිර තුඩුව දක්වා නැගෙනහිරින් ඇතින්ම අඳින ලද සෘජු රේඛාවට සහ 63 වන දේශාංශකය වූ ඇන්ටිකොස්ටි දූපතේ උතුරු පැත්තට හුදෙක්ම යාත්‍රා කරන ශ්‍රී ලාංකික නැව්වලට අදාළ නොවිය යුතු ය.

3\. (1) සාමාන්‍යයෙන් ජාත්‍යන්තර මුහුදු ගමන්වල නිරත නොවන එහෙත් විශේෂ අවස්ථානුගත කරුණුවල දී, තනි ජාත්‍යන්තර මුහුදු ගමනක් භාර ගැනීමට නියම කරනු ලැබ ඇති යම් නෞකාවක් (මේ නියෝගවල "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සම්මුතියේ යම් නියමයන්වලින් නිදහස් කරනු ලැබිය හැකි යඃ

එසේ වුවද, එවැනි නෞකාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතය අනුව එම නෞකාව විසින් භාර ගැනීමට නියමිත මුහුදු ගමන සඳහා ප්‍රමාණවත් ආරක්ෂණ නියමයන් සමග අනුකූල විය යුතු ය.

(2) (අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, නව ආකාරයක අංග අන්තර්ගත වන යම් නෞකාවක්, පර්යේෂණ සඳහා සහ නෞකාවල එවැනි අංග ඇතුළත් කිරීම සඳහා, සම්මුතියේ II-1, II-2, III සහ IV වන පරිච්ඡේදවල යම් විධිවිධාන වලින් නිදහස් කරනු ලැබිය හැකි යඃ

එසේ වුවද, එවැනි නෞකා, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මතය අනුව එම නෞකා විසින් සැපයීමට අදහස් කරන සේවය සඳහා ප්‍රමාණවත් වන සහ නෞකාවේ සමස්ත ආරක්ෂාව තහවුරු කිරීමට අවශ්‍ය වන මෙන්ම එම නෞකාව ගමන් කිරීමට නියමිත රාජ්‍යයන්ගේ ආණ්ඩු විසින් පිළිගනු ලැබිය හැකි ආරක්ෂණ නියමයන් සමග අනුකූල විය යුතු ය.

(ආ) මෙම නියෝගය යටතේ නෞකාව නිදහස් කරන්නා වූ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එහි විස්තර සහ එසේ කිරීමට හේතු (මේ නියෝගවල "සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

### සමීක්ෂණ සහ සහතික

4\. සම්මුතියේ විධිවිධාන බලාත්මක කිරීමට අදාළ වන තාක් දුරට, නැව් පරීක්ෂා කිරීම සහ සමීක්ෂණය කිරීම නිලධරයන්ගේ සහාය ඇතිව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

5\. (1) සංවිධානය විසින් පිළිගන්නා ලද, පිළිගත් සංවිධාන සඳහා වූ ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, 4 වන නියෝගයේ කාර්යය සඳහා, (මේ නියෝගවල "පිළිගත් සංවිධානය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් සංවිධානයක් පිළිගනු ලැබිය හැකි අතර, එකී පිළිගත් සංවිධානයට යම් නෞකාවක අලුත්වැඩියා කිරීම් වලට සහභාගීවීමට සහ පරීක්ෂා කිරීම් සහ සමීක්ෂණය කිරීම් සිදු කිරීම සඳහා අවම බලය තිබිය යුතු ය.

(2) පිළිගත් සංවිධාන වෙත පවරා දෙනු ලබන අධිකාරයේ විශේෂ වගකීම් සහ කොන්දේසි පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සංවිධානය වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

6\. (1) නෞකාවේ සහ එහි උපකරණවල තත්ත්වය සහතිකයේ විස්තර සමග සාරානුකූලව අනුරූප නොවන බවට හෝ නෞකාව, එම නෞකාවට හෝ නෞකාස්ථ තැනැත්තන්ට අන්තරායක් ඇති නොවන පරිදි මුහුදට දියත් කිරීමට සුදුසු නොවන බවට යම් පිළිගත් සංවිධානයක් විසින් නිශ්චය කරනු ලබන අවස්ථාවක දී, නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගනු ලබන බවට එම සංවිධානය විසින් වහාම සහතික විය යුතු අතර, යථා කාලයේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත එය දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) එවැනි නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග නොගන්නේ නම් අදාළ සහතිකය අවලංගු කරනු ලැබිය යුතු අතර, වහාම අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරනු ලැබිය යුතු ය. එමෙන්ම නෞකාව ඇත්තේ වෙනත් පාර්ශවයක වරායක නම් වරාය අයත් රාජ්‍යයේ නිසි බලධරයන් ද වහාම දැනුවත් කරනු ලැබිය යුතු ය.

(3) ඒ ආකාරයෙන් ශ්‍රී ලංකා ජල තීරයේ ඇති විදේශීය යාත්‍රාවක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා දැනුවත් කරනු ලැබූ විට, නෞකාවට හෝ එහි ගමන් කරන පුද්ගලයන්ට අන්තරායක් ඇති නොවන පරිදි නෞකාව මුහුදට දියත් කිරීමට හැකි වන තෙක් එය යාත්‍රා නොකරන බවට හෝ සුදුසු අලුත්වැඩියා කිරීමේ අංගනයක් වෙත ගමන් කිරීමේ කාර්යය සඳහා වරායෙන් පිටත් නොවන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහතික විය යුතු ය.

7\. (1) යම් මගී නෞකාවක් පහත සඳහන් කර ඇති පරීක්ෂා කිරීම් සහ සමීක්ෂණය කිරීම්වලට යටත් විය යුතු ය -

(අ) නෞකාව සේවයේ යෙදවීමට පෙර මූලික සමීක්ෂණයක්;

(ආ) සම්මුතියේ I වන පරිච්ඡේදයේ 14(ආ), (ඉ), (ඊ) සහ (උ) වන නියෝග අදාළ වන අවස්ථාවල දී හැර, සෑම මාස දොළහකටම වරක් අලුත් කිරීමේ සමීක්ෂණයක්; සහ

(ඇ) අවශ්‍යතාව මතු වන පරිදි අතිරේක සමීක්ෂණ.

(2) ඉහත සඳහන් කරන ලද සමීක්ෂණ සම්මුතියේ I වන පරිච්ඡේදයේ 7(ආ) වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි සිදු කරනු ලැබිය යුතු ය.

8\. (1) දළ ටොන් පන්සියය හෝ ඊට වැඩි භාණ්ඩ නෞකාවක් එහි ජීවිතාරක්ෂක උපකරණ සහ වෙනත් උපකරණ සම්බන්ධයෙන් පහත දක්වා ඇති සමීක්ෂණය කිරීම්වලට යටත් විය යුතු ය-

(අ) නෞකාව සේවයේ යෙදවීමට පෙර, භාණ්ඩ නෞකා ආරක්ෂක උපකරණ පිළිබඳ මූලික සමීක්ෂණයක්;

(ආ) සම්මුතියේ I වන පරිච්ඡේදයේ 14(ආ), (ඉ), (ඊ) සහ (උ) වන නියෝග අදාළ වන අවස්ථාවලදී හැර, සෑම අවුරුදු පහකට වරක්ම භාණ්ඩ නෞකා ආරක්ෂක උපකරණ පිළිබඳ අලුත් කිරීමේ සමීක්ෂණයක්;

(ඇ) යම් භාණ්ඩ නෞකා ආරක්ෂක උපකරණ සහතිකයක දෙවන හෝ තෙවන සාංවත්සරික දිනයක පෙර හෝ පසු මාස තුනක කාලයක් ඇතුළත, භාණ්ඩ නෞකා ආරක්ෂක උපකරණ පිළිබඳ වාරික සමීක්ෂණයක්;

(ඈ) අදාළ කාලසීමාව තුළ වාරික සමීක්ෂණයක් සිදු කිරීමට නියමිත වන අවස්ථාවල දී හැර, භාණ්ඩ නෞකා ආරක්ෂක උපකරණ සහතිකයේ එක් එක් සාංවත්සරික දිනයට පෙර හෝ පසු මාස තුනක කාලයක් ඇතුළත, වාර්ෂික සමීක්ෂණයක්; සහ

(ඉ) සම්මුතියේ I වන පරිච්ඡේදයේ 7(ආ)(iii) වන නියෝගයේ මගී නෞකා සඳහා විධිවිධාන සලස්වනු ලැබිය හැකි පරිදි අතිරේක සමීක්ෂණයක්.

(2) (1) වන උප නියෝගයේ (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) වන ඡේදවල සඳහන් කර ඇති සමීක්ෂණය කිරීම් සම්මුතියේ I වන පරිච්ඡේදයේ 8(ආ) වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි සිදු කරනු ලැබිය යුතු ය.

(3) 8(1) වන නියෝගයේ (ඇ) සහ (ඈ) වන ඡේදවල සඳහන් කර ඇති වාරික සහ වාර්ෂික සමීක්ෂණය කිරීම්, භාණ්ඩ නෞකා ආරක්ෂක උපකරණ සහතිකයේ පිටසන් කරනු ලැබිය යුතු ය.

9. (1) සම්මුතියේ III වන සහ IV වන පරිච්ඡේද අදාළ වන්නා වූ භාණ්ඩ නෞකාවක්, එහි ජීවිතාරක්ෂක උපකරණවල භාවිත කරනු ලබන ඒවා ඇතුළුව රේඩියෝ සවි කිරීම් සම්බන්ධයෙන් පහත දැක්වෙන සමීක්ෂණය කිරීම්වලට යටත් විය යුතු ය

(අ) නෞකාව සේවයේ යෙදවීමට පෙර, භාණ්ඩ නෞකා රේඩියෝ සවි කිරීම් පිළිබඳ මූලික සමීක්ෂණයක්;

(ආ) සම්මුතියේ I වන පරිච්ඡේදයේ 14(ආ), (ඉ), (ඊ) සහ (උ) යන නියෝග අදාළ වන අවස්ථාවල දී හැර, සෑම අවුරුදු පහකට වරක්ම භාණ්ඩ නෞකා ආරක්ෂක උපකරණ පිළිබඳ අලුත් කිරීමේ සමීක්ෂණයක්;

(ඇ) නෞකාවේ භාණ්ඩ නෞකා ආරක්ෂක රේඩියෝ සහතිකයේ එක් එක් සංවත්සර දිනයට පෙර හෝ පසු මාස තුනක කාලයක් ඇතුළත, භාණ්ඩ නෞකා රේඩියෝ සවි කිරීම් පිළිබඳ වාරික සමීක්ෂණයක්;

(ඈ) සම්මුතියේ I වන පරිච්ඡේදයේ 7(ආ)(iii) වන නියෝගයේ මගී නෞකා සඳහා විධිවිධාන සලස්වනු ලැබිය හැකි පරිදි අතිරේක සමීක්ෂණයක්.

(2) (1) වන උප නියෝගයේ (අ), (ආ), (ඇ) සහ (ඈ) වන ඡේදවල සඳහන් කරන ලද සමීක්ෂණය කිරීම් සම්මුතියේ I වන පරිච්ඡේදයේ 9(ආ) වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි සිදු කරනු ලැබිය යුතු ය.

(3) 9(1) වන නියෝගයේ (ඇ) වන ඡේදයේ සඳහන් කරන ලද වාරික සමීක්ෂණය කිරීම්, භාණ්ඩ නෞකා ආරක්ෂණ රේඩියෝ සහතිකයේ පිටසන් කරනු ලැබිය යුතු ය.

10. (1) දළ ටොන් පන්සියය හෝ ඊට වැඩි යම් භාණ්ඩ නෞකාවක්, 8 වන සහ 9 වන නියෝග අදාළ වන්නා වූ උපකරණ හැර එම නෞකාවේ ආකෘතිය, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සම්බන්ධයෙන් පහත දැක්වෙන සමීක්ෂණය කිරීම් සහ පරීක්ෂා කිරීම්වලට යටත් විය යුතු ය-

(අ) නෞකාව සේවයේ යෙදවීමට පෙර, නෞකාවේ පතුලේ පිටත කොටස පරීක්ෂා කිරීමක් ඇතුළුව මූලික සමීක්ෂණයක්;

(ආ) සම්මුතියේ I වන පරිච්ඡේදයේ 14(ආ), (ඉ), (ඊ) සහ (උ) යන නියෝග අදාළ වන අවස්ථාවල දී හැර සෑම අවුරුදු පහකට වරක්ම භාණ්ඩ නෞකා ආරක්ෂණ ඉදිකිරීම් පිළිබඳ අලුත් කිරීමේ සමීක්ෂණයක්;

(ඇ) (ඈ) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති වාර්ෂික සමීක්ෂණය කිරීම් වලින් එක් සමීක්ෂණය කිරීමක් සිදු විය යුතු වන, භාණ්ඩ නෞකා ආරක්ෂක ඉදි කිරීම් පිළිබඳ සහතිකයක දෙවන හෝ තෙවන සංවත්සර දිනයට පෙර හෝ පසු මාස තුනක කාලයක් ඇතුළත, භාණ්ඩ නෞකා ඉදි කිරීම් පිළිබඳ අන්තර් මධ්‍යම සමීක්ෂණයක්;

(ඈ) අදාළ කාල සීමාව තුළ භාණ්ඩ නෞකා ඉදිකිරීම පිළිබඳ අලුත් කිරීමේ හෝ අන්තර්මධ්‍යම සමීක්ෂණය කිරීමක් සිදු කරනු ලැබීමට නියමිත වන අවස්ථාවල දී හැර, නෞකාවේ භාණ්ඩ නෞකා ආරක්ෂක ඉදිකිරීම් පිළිබඳ සහතිකයේ එක් එක් සංවත්සර දිනයට පෙර හෝ පසු මාස තුනක කාලයක් ඇතුළත දී, භාණ්ඩ නෞකා ඉදි කිරීම පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක්; සහ

(ඉ) 14(5) වන හෝ (6) වන නියෝග අදාළ වන අවස්ථාවල දී හැර ඕනෑම අවුරුදු පහක කාල සීමාවක් ඇතුළත, ජලයෙන් පිටත දී සිදු කළ යුතු නෞකාවේ පතුලේ පිටත කොටස පිළිබඳ අවම වශයෙන් පරීක්ෂා කිරීම් දෙකක්. 14(5) වන හෝ (6) වන නියෝග අදාළ වන අවස්ථාවල දී, මෙම අවුරුදු පහක කාල සීමාව, සහතිකයේ වලංගු කාලය දීර්ඝ කරනු ලබන කාල සීමාව සමඟ සමපාත වන පරිදි දීර්ඝ කරනු ලැබිය හැකි ය. සියලුම අවස්ථාවල දී එවැනි ඕනෑම පරීක්ෂා කිරීම් දෙකක් අතර කාලය මාස තිස් හයක් නොඉක්මවිය යුතු ය; සහ

(ඊ) සම්මුතියේ I වන පරිච්ඡේදය 7 (ආ) (iii) වන නියෝගයේ මගී නෞකා සඳහා විධිවිධාන සලස්වනු ලබන පරිදි අතිරේක සමීක්ෂණය කිරීමක්.

(2) (1) වන උප නියෝගයේ (අ), (ආ), (ඇ), (ඈ) සහ (ඉ) වන ඡේදවල සඳහන් කරන ලද සමීක්ෂණය කිරීම් සහ පරීක්ෂා කිරීම්, සම්මුතියේ I වන පරිච්ඡේදයේ 10 (ආ) වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි සිදු කරනු ලැබිය යුතු ය.

(3) (1) වන නියෝගයේ (ඇ), (ඈ) සහ (ඉ) යන ඡේදවල සඳහන් කර ඇති නෞකාවේ පිටත පිළිබඳ අන්තර්මධ්‍යම සහ වාර්ෂික සමීක්ෂණ සහ පරීක්ෂණ, භාණ්ඩ නෞකා ආරක්ෂණ ඉදි කිරීම් පිළිබඳ සහතිකයේ පිටසන් කරනු ලැබිය යුතු ය.

11. (1) මේ නියෝග අදාළ වන සෑම නෞකාවක ම අයිතිකරු හෝ නෞකාධිපතිවරයා විසින් -

(අ) නෞකාවට හෝ නෞකාස්ථ තැනැත්තන්ට අන්තරායක් නොවන පරිදි මුහුදට දියත් කිරීම සඳහා සෑම අතින් ම සුදුසු තත්ත්වයක නෞකාව පවතින බව සහතික කර ගැනීම පිණිස නෞකාවේ සහ එහි උපකරණවල තත්ත්වය නඩත්තු කර ඇති බවට;

(ආ) මෙම නියෝග මගින් නියම කරනු ලබන නෞකාවේ යම් සමීක්ෂණයක් සිදු කර අවසන් කිරීමෙන් පසුව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමතයකින් තොරව, ව්‍යුහාත්මක සකස් කිරීම්වල, යන්ත්‍ර සූත්‍රවල, උපකරණවල සහ සමීක්ෂණය මගින් ආවරණය කෙරෙන වෙනත් අයිතමවල කිසිඳු වෙනසක් සිදු නොකරනු ලැබිය යුතු බවට;

(ඇ) නෞකාවේ ආරක්ෂාවට හෝ එහි ජීවිතාරක්ෂක උපකරණ හෝ වෙනත් උපකරණවල කාර්යක්ෂමතාව හෝ පරිපූර්ණත්වයට බලපෑමක් වන යම් හදිසි අනතුරක් නෞකාවට සිදු වන හෝ යම් දෝෂයක් අනාවරණය වන අවස්ථාවක දී-

(i) එය හැකිතාක් ඉක්මනින් අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ පිළිගත් සංවිධානයක් වෙත වාර්තා කරනු ලබන බවට; සහ

(ii) යම් ශ්‍රී ලාංකික නෞකාවක් ශ්‍රී ලංකාවෙන් පිටත යම් වරායක දී එවැනි අවස්ථාවකට පත් වුවහොත්, එය එකී වරාය පිහිටා ඇති රටේ නිසි බලධාරීන් වෙත ද වාර්තා කරනු ලබන බවට;

වග බලා ගත යුතු ය.

12. (1) සම්මුතියේ II-1, II-2, III, IV සහ V වන පරිච්ඡේදවල අදාළ නියමයන් සහ සම්මුතියේ අදාළ වෙනත් යම් නියමයන් සමග අනුකූල වන යම් මගී නෞකාවක් වෙත, මූලික හෝ අලුත් කිරීමේ සමීක්ෂණයකින් පසු, මගී නෞකා ආරක්ෂණ සහතිකය යනුවෙන් හඳුන්වනු ලබන සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (ගිනි ආරක්ෂක පද්ධති සහ උපකරණවලට සහ ගිනි මැඩපැවැත්වීමේ සැලසුම්වලට අදාළ වන නියමයන් හැර) සම්මුතියේ II-1, II-2 වන පරිච්ඡේදවල අදාළ නියමයන් සහ සම්මුතියේ අදාළ වෙනත් යම් නියමයන් සමග අනුකූල වන යම් භාණ්ඩ නෞකාවක් වෙත, මූලික හෝ අලුත් කිරීමේ සමීක්ෂණයකින් පසු, භාණ්ඩ නෞකා ආරක්ෂණ ඉදිකිරීම් සහතිකය යනුවෙන් හඳුන්වනු ලබන සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) සම්මුතියේ II-1, II-2, III සහ V වන පරිච්ඡේදවල අදාළ නියමයන් සහ සම්මුතියේ අදාළ වෙනත් යම් නියමයන් සමග අනුකූල වන යම් භාණ්ඩ නෞකාවක් වෙත, මූලික හෝ අලුත් කිරීමේ සමීක්ෂණයකින් පසු, භාණ්ඩ නෞකා ආරක්ෂක උපකරණ සහතිකය යනුවෙන් හඳුන්වනු ලබන සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය."

(4) සම්මුතියේ IV වන පරිච්ඡේදයේ අදාළ නියමයන් සහ සම්මුතියේ අදාළ වෙනත් යම් නියමයන් සමග අනුකූල වන යම් භාණ්ඩ නෞකාවක් වෙත, මූලික හෝ අලුත් කිරීමේ සමීක්ෂණයකින් පසු, භාණ්ඩ නෞකා රේඩියෝ සහතිකය යනුවෙන් හඳුන්වනු ලබන සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(5) (අ) සම්මුතියේ II-1, II-2, III, IV සහ V වන පරිච්ඡේදවල අදාළ නියමයන් සහ සම්මුතියේ අදාළ වෙනත් යම් නියමයන් සමග අනුකූල වන යම් භාණ්ඩ නෞකාවක් වෙත, (2) වන, (3) වන සහ (4) වන උප නියෝගවල සඳහන් කරන ලද සහතිකවලට විකල්පයක් ලෙස, භාණ්ඩ නෞකා ආරක්ෂණ සහතිකය යනුවෙන් හඳුන්වනු ලබන සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(ආ) මෙම නියෝගවල යම් භාණ්ඩ නෞකා ආරක්ෂණ ඉදිකිරීම් සහතිකයක්, භාණ්ඩ නෞකා ආරක්ෂණ උපකරණ සහතිකයක් හෝ භාණ්ඩ නෞකා ආරක්ෂණ රේඩියෝ සහතිකයක් සම්බන්ධයෙන් සඳහන් කිරීමක් සිදු කරනු ලබන කවර හෝ අවස්ථාවක දී, මෙම සහතිකවලට විකල්පයක් ලෙස භාණ්ඩ නෞකා ආරක්ෂණ සහතිකයක් භාවිත කරනු ලබන්නේ නම්, එකී සඳහන් එකී භාණ්ඩ නෞකා ආරක්ෂණ සහතිකයට ද අදාළ විය යුතු ය.

(6) මෙම නියෝගයේ සඳහන් කරන ලද මගී නෞකා ආරක්ෂණ සහතිකය, භාණ්ඩ නෞකා ආරක්ෂණ උපකරණ සහතිකය, භාණ්ඩ නෞකා ආරක්ෂණ රේඩියෝ සහතිකය සහ භාණ්ඩ නෞකා ආරක්ෂණ සහතිකය, උපකරණ පිළිබඳ වාර්තාවක් මගින් අතිරේකයක් ලෙස සපයනු ලැබිය යුතු ය.

(7) (අ) යම් නෞකාවකට, සම්මුතියේ විධිවිධාන යටතේ සහ ඊට අනුකූලව යම් නිදහස් කිරීමක් ලබා දී ඇති විටක දී, මෙම නියෝගය යටතේ නිකුත් කරනු ලබන සහතිකවලට අතිරේකව නිදහස් කිරීමේ සහතිකය යනුවෙන් හඳුන්වනු ලබන සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය. නිදහස් කිරීමේ සහතිකයක වලංගු කාල සීමාව එයට අදාළ වන සහතිකයේ වලංගු කාල සීමාවට වඩා දීර්ඝ නොවිය යුතු අතර, එම නිදහස් කිරීමේ සහතිකයට අදාළ වන සහතිකයේ දීර්ඝ කිරීම්වලට ද වෙනත් විධිවිධානවලට ද යටත් විය යුතු ය. නිදහස් කිරීම් ලබා දීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කරනු ලැබිය යුතු ය.

(ආ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, සාධාරණ දැන්වීමක් ලබාදීමෙන් පසු (අ) වන උප නියෝගය යටතේ ලබාදෙන ලද යම් නිදහස් කිරීමක් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම සිදු කළ හැකි ය.

(8) (7) වන උපනියෝගයේ සඳහන් කරන ලද නිදහස් කිරීමේ සහතිකය හැර මෙම නියෝගයේ සඳහන් කරන ලද සහතික, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ සෑම අවස්ථාවක දී ම, සහතික සඳහා පූර්ණ වගකීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවරා දෙනු ලබන පිළිගත් සංවිධානයක් විසින් නිකුත් කරනු හෝ පිටසන් කරනු ලැබිය යුතු ය.

13. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, සම්මුතිය අදාළ වන රටක ආණ්ඩුව විසින් සිදු කරනු ලබන ඉල්ලීමක් මත, එම රටෙහි ලියාපදිංචි නෞකාවක් සමීක්ෂණය කරනු ලැබිය හැකි අතර, සම්මුතියේ නියමයන් සමග අනුකූල වන බවට සෑහීමකට පත් වන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එම නෞකාව වෙත, 12 වන නියෝගයෙහි සඳහන් කරන ලද සහතික නිකුත් කළ යුතු මෙන්ම උචිත අවස්ථාවල දී, සම්මුතියේ නියමයන්ට අනුකූලව එම සහතික පිටසන් කළ යුතු ය. එසේ නිකුත් කරනු ලබන යම් සහතිකයක, එය නිකුත් කරනු ලැබ ඇත්තේ නෞකාවේ ප්‍රදර්ශනය කරනු ලබන්නේ හෝ ප්‍රදර්ශනය කරනු ලැබීමට හිමිකම ඇත්තේ කවර ධජයක් ද එකී ධජය අයත් රාජ්‍යයේ ආණ්ඩුව විසින් කරන ලද ඉල්ලීමක් මත බව දැක්වෙන ප්‍රකාශනයක් අන්තර්ගත විය යුතු අතර, එයට 12 වන නියෝගය යටතේ නිකුත් කරන ලබන සහතිකයකට තිබෙන බලයම තිබිය යුතු මෙන්ම ඒ හා සමාන පිළිගැනීමම ලැබිය යුතු ය.

(2) ශ්‍රී ලාංකික නැවක් සමීක්ෂණය කිරීමටත්, සම්මුතියේ නියමයන්ට අනුකූල වන බවට සෑහීමට පත්වන්නේ නම්, සම්මුතියට අනුකූලව නැවට සහතික නිකුත් කිරීමටත් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සම්මුතිය අදාළ වන රටක ආණ්ඩුවෙන් ඉල්ලා සිටිය හැකි ය. එසේ නිකුත් කරනු ලබන යම් සහතිකයක, එය නිකුත් කරන ලද්දේ ශ්‍රී ලංකා ආණ්ඩුවේ ඉල්ලීම මත බවට වූ ප්‍රකාශයක් ඇතුළත් විය යුතු අතර ඊට, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන සහතිකයකට තිබෙන බලයම තිබිය යුතු සේම ඒ හා සමාන පිළිගැනීම ද ලැබිය යුතු ය.

14. (1) මගී නැව් ආරක්ෂණ සහතිකයක් මාස දොළහකට නොවැඩි කාල සීමාවක් සඳහා නිකුත් කරනු ලැබිය යුතු ය. භාණ්ඩ නැව් ආරක්ෂණ ඉදිකිරීම් සහතිකයක්, භාණ්ඩ නැව් ආරක්ෂණ උපකරණ සහතිකයක් සහ භාණ්ඩ නැව් ආරක්ෂණ රේඩියෝ සහතිකයක් අවුරුදු පහක කාල සීමාවක් සඳහා නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (අ) (1) වන ඡේදයේ නියමයන් නොතකා, දැනට පවතින සහතිකයේ කල් ඉකුත්වීමේ දිනට පෙර මාස තුනක් ඇතුළත අලුත් කිරීමේ සමීක්ෂණය සම්පූර්ණ කරනු ලබන විට, අලුත් කිරීමේ සමීක්ෂණය සම්පූර්ණ කරනු ලබන දින සිට අලුත් සහතිකය -

(i) මගී නෞකාවක් සඳහා, දැනට පවතින සහතිකයේ කල් ඉකුත්වන දින සිට මාස දොළහක් නොඉක්මවන දිනයක් දක්වා වලංගු විය යුතු ය;

(ii) භාණ්ඩ නෞකාවක් සඳහා, දැනට පවතින සහතිකයේ කල් ඉකුත්වන දින සිට අවුරුදු පහක් නොඉක්මවන දිනයක් දක්වා වලංගු විය යුතු ය.

(ආ) දැනට පවතින සහතිකයේ කල් ඉකුත් වන දිනයට පසු අලුත් කිරීමේ සමීක්ෂණය සම්පූර්ණ කරනු ලබන විට, අලුත් කිරීමේ සමීක්ෂණය සම්පූර්ණ කරනු ලබන දින සිට අලුත් සහතිකය

(i) මගී නෞකාවක් සඳහා, දැනට පවතින සහතිකයේ කල් ඉකුත්වන දින සිට මාස දොළහක් නොඉක්මවන දිනයක් දක්වා වලංගු විය යුතු ය;

(ii) භාණ්ඩ නෞකාවක් සඳහා, දැනට පවතින සහතිකයේ කල් ඉකුත්වන දින සිට අවුරුදු පහක් නොඉක්මවන දිනයක් දක්වා වලංගු විය යුතු ය.

(ඇ) දැනට පවතින සහතිකයේ කල් ඉකුත්වන දිනයට පෙර මාස තුනකට වඩා වැඩි කාලයකට පෙර අලුත් කිරීමේ සමීක්ෂණය සම්පූර්ණ කරනු ලබන විට, අලුත් කිරීමේ සමීක්ෂණය සම්පූර්ණ කරනු ලබන දින සිට අලුත් සහතිකය-

(i) මගී නෞකාවක් සඳහා, අලුත් කිරීමේ සමීක්ෂණය සම්පූර්ණ කරනු ලබන දින සිට මාස දොළහක් නොඉක්මවන දිනයක් දක්වා වලංගු විය යුතු ය;

(ii) භාණ්ඩ නෞකාවක් සඳහා, අලුත් කිරීමේ සමීක්ෂණය සම්පූර්ණ කරනු ලබන දින සිට අවුරුදු පහක් නොඉක්මවන දිනයක් දක්වා වලංගු විය යුතු ය.

(3) මගී නෞකා ආරක්ෂණ සහතිකයක් හැර වෙනත් යම් සහතිකයක් අවුරුදු පහකට වඩා අඩු කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලබන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, කල් ඉකුත්වීමේ දිනය ඉක්මවා (1) වන උප නියෝගයේ නිශ්චිතව සඳහන් කර ඇති උපරිම කාලසීමාවක් දක්වා සහතිකයේ වලංගුභාවය දීර්ඝ කරනු ලැබිය හැකි ය, එසේ වුව ද, සහතිකයක් අවුරුදු පහක කාලසීමාවක් සඳහා නිකුත් කරනු ලබන විට, අදාළ 8 වන, 9 වන සහ 10 වන නියෝගවල සඳහන් සමීක්ෂණ සුදුසු පරිදි පවත්වනු ලැබේ.

(4) අලුත් කිරීමේ සමීක්ෂණයක් සම්පූර්ණ කරනු ලැබ ඇත්නම් සහ දැනට පවතින සහතිකයේ කල් ඉකුත්වීමේ දිනයට පෙර අලුත් සහතිකයක් නිකුත් කිරීමට හෝ නෞකාස්ථ කිරීමට නොහැකි නම්, පිළිගත් සංවිධානය විසින් දැනට පවතින සහතිකය පිටසන් කරනු ලැබිය හැකි අතර, එවැනි සහතිකයක්, එහි කල් ඉකුත්වීමේ දින සිට මාස පහකට නොවැඩි විය යුතු වැඩිදුර කාලසීමාවක් සඳහා වලංගු වන පරිදි පිළිගනු ලැබිය යුතු ය.

(5) සහතිකයක් කල් ඉකුත්වන අවස්ථාවේ දී, නැවක් එම නැව සමීක්ෂණය කරනු ලබන වරාය තුළ නොමැති නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහතිකයේ වලංගු කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි නමුත්, එම නැව සමීක්ෂණය කරනු ලබන්නේ යම් වරායකදී ද එම වරාය වෙත එහි මුහුදු ගමන සම්පූර්ණ කිරීමට ඉඩ ලබා දීමේ කාර්යය සඳහා පමණක් මෙන්ම එසේ කිරීම යෝග්‍ය හා සාධාරණ වන බව පෙනී යන අවස්ථාවල දී පමණක්, මේ දීර්ඝ කිරීම ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

(6) කිසිදු සහතිකයක් මාස තුනකට වඩා වැඩි කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු නොලැබිය යුතු අතර, දීර්ඝ කිරීමක් ලද නැවක්, එය සමීක්ෂණය කරනු ලබන වරායට පැමිණීමක් සමග, එකී දීර්ඝ කිරීම ප්‍රකාරවම අලුත් සහතිකයක් ලබා ගැනීමෙන් තොරව එම වරායෙන් පිටත්වීමට සුදුසුකම් නොලැබිය යුතු ය. අලුත් කිරීමේ සමීක්ෂණය සම්පූර්ණ කරනු ලබන විට, අලුත් සහතිකය -

(අ) මගී නෞකාවක් සඳහා, දීර්ඝ කිරීම ප්‍රදානය කරනු ලැබීමට පෙර, දැනට පවතින සහතිකයේ කල් ඉකුත්වීමේ දින සිට මාස දොළහක් නොඉක්මවන දිනයක් දක්වා වලංගු විය යුතු ය;

(ආ) භාණ්ඩ නෞකාවක් සඳහා, දීර්ඝ කිරීම ප්‍රදානය කරනු ලැබීමට පෙර, දැනට පවතින සහතිකයේ කල් ඉකුත්වීමේ දින සිට අවුරුදු පහක් නොඉක්මවන දිනයක් දක්වා වලංගු විය යුතු ය-

(7) මේ නියෝගයේ ඉහත සඳහන් විධිවිධාන යටතේ වලංගුභාවය දීර්ඝ කරනු නොලැබූ කෙටි මුහුදු ගමන්වල නිරත වන නෞකාවකට නිකුත් කරන ලද සහතිකයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එහි සඳහන් කල් ඉකුත්වීමේ දින සිට එක් මාසයක් දක්වා වූ සහන කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය. අලුත් කිරීමේ සමීක්ෂණය සම්පූර්ණ කරනු ලබන විට, අලුත් සහතිකය -

(අ) මගී නෞකාවක් සඳහා, දීර්ඝ කිරීම ප්‍රදානය කරනු ලැබීමට පෙර, දැනට පවතින සහතිකයේ කල් ඉකුත්වීමේ දින සිට මාස දොළහක් නොඉක්මවන්නා වූ දිනයක් දක්වා වලංගු විය යුතු ය;

(ආ) භාණ්ඩ නෞකාවක් සඳහා, දීර්ඝ කිරීම ප්‍රදානය කරනු ලැබීමට පෙර, දැනට පවතින සහතිකයේ කල් ඉකුත්වීමේ දින සිට අවුරුදු පහක් නොඉක්මවන දිනයක් දක්වා වලංගු විය යුතු ය.

(8) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන විශේෂ අවස්ථානුගත කරුණුවල දී, (2) වන උපනියෝගයේ (ආ) ඡේදය, (5) වන උපනියෝගය හෝ (6) වන උපනියෝගය මගින් නියම කරනු ලබන පරිදි, දැනට පවතින සහතිකයේ කල් ඉකුත්වීමේ දින සිට අලුත් සහතිකයේ දින නියම කරනු නොලැබිය හැකි ය. මේ විශේෂ අවස්ථානුගත කරුණුවල දී, අලුත් සහතිකය -

(අ) මගී නෞකාවක් සඳහා, අලුත් කිරීමේ සමීක්ෂණය සම්පූර්ණ කරනු ලබන දින සිට මාස දොළහක් නොඉක්මවන දිනයක් දක්වා වලංගු විය යුතු ය;

(ආ) භාණ්ඩ නෞකාවක් සඳහා, අලුත් කිරීමේ සමීක්ෂණය සම්පූර්ණ කරනු ලබන දින සිට අවුරුදු පහක් නොඉක්මවන දිනයක් දක්වා වලංගු විය යුතු ය.

(9) වාර්ෂික, අන්තර්-මධ්‍යම හෝ වාරික සමීක්ෂණයක්, මේ නියෝගවල නිශ්චිතව සඳහන් කාලසීමාවට පෙර සම්පූර්ණ කරනු ලබන්නේ නම් -

(අ) අදාළ සහතිකයේ දක්වා ඇති සාංවත්සරික දිනය, සමීක්ෂණය සම්පූර්ණ කරනු ලැබූ දිනයට මාස තුනකට වඩා පසු නොවන දිනයකට පිටසන මගින් සංශෝධනය කරනු ලැබිය යුතු ය;

(ආ) අවශ්‍ය ඊළඟ වාර්ෂික, අන්තර්-මධ්‍යම හෝ වාරික සමීක්ෂණය, අලුත් සාංවත්සරික දිනය භාවිත කරමින් මේ නියෝග මගින් නියම කරනු ලබන යම් විරාමවල දී සම්පූර්ණ කරනු ලැබිය යුතු ය;

(ඇ) මේ නියෝග මඟින් නියම කරනු ලබන සමීක්ෂණ අතර පවත්නා උපරිම විරාම නොඉක්මවන අදහසින් සුදුසු පරිදි වාර්ෂික, අන්තර්-මධ්‍යම හෝ වාරික සමීක්ෂණ එකක් හෝ ඊට වැඩි ගණනක් පවත්වනු ලබන්නේ නම්, කල් ඉකුත්වීමේ දිනය නොවෙනස්ව පැවතිය හැකි ය.

(10) 12 වන හෝ 13 වන නියෝගය යටතේ නිකුත් කරනු ලබන සහතිකයක් වලංගු වීම පහත දැක්වෙන කුමන හෝ අවස්ථාවක දී නතර විය යුතු ය-

(අ) අදාළ සමීක්ෂණ සහ පරීක්ෂණ, 7(1) වන, 8(1) වන, 9(1) වන සහ 10(1) වන නියෝග යටතේ නිශ්චිතව සඳහන් කාල සීමාවක් ඇතුළත සම්පූර්ණ කර නොමැති නම්;

(ආ) සහතිකය සම්මුතියට අනුකූලව පිටසන් කර නොමැති නම්; හෝ

(ඇ) වෙනත් රාජ්‍යයක ධජයක් කරා නැව මාරු කරනු ලැබීමේ දී.

(11) (9) වන උපනියෝගය යටතේ සහතිකයක් වලංගුවීම නතරවන අවස්ථාවක දී, නැව, 11(1) වන නියෝගයේ (අ) සහ (ආ) ඡේදයන් හි නියමයන්ට අනුකූල වන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සම්පූර්ණයෙන් ම සෑහීමට පත් වන විට පමණක් අලුත් සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය. සම්මුතිය අදාළ වන වෙනත් රාජ්‍යයක් වෙත යම් ශ්‍රී ලාංකික නැවක් මාරු කරනු ලබන අවස්ථාවක දී, එකී මාරු කිරීම සිදු වී මාස තුනක් ඇතුළත ඉල්ලීමක් කරනු ලබන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මාරු කිරීමට පෙර නැව මගින් පවත්වාගෙන ගිය සහතිකවල පිටපත් සහ අදාළ සමීක්ෂණ වාර්තාවල පිටපත් තිබේ නම් ඒවා ද එම රාජ්‍යයේ පරිපාලනය වෙත හැකිතාක් ඉක්මනින් යවනු ලැබිය යුතු ය.

(12) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ශ්‍රී ලාංකික නැවකට නිකුත් කරන ලද සහතිකයක් -

(අ) එම සහතිකය, අසත්‍ය හෝ වැරදි සහගත තොරතුරක් මත නිකුත් කරනු ලැබ ඇති බවට;

(ආ) නෞකාවේ ව්‍යුහය, උපකරණ හෝ යන්ත්‍ර සූත්‍රවලට හානි සිදු වී ඇති බවට හෝ අන්‍යාකාරයෙන් අසම්පූර්ණව පවතින බවට,

විශ්වාස කිරීමට හේතු පවතින අවස්ථාවක දී, එම සහතිකය අවලංගු කරනු ලැබිය හැකි ය.

(13) ශ්‍රී ලාංකික නැවකට නිකුත් කරන ලද කල් ඉකුත් වී ඇති හෝ අවලංගු කරනු ලැබ ඇති සහතිකයක් භාර දෙන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(14) කිසිදු තැනැත්තකු විසින් -

(අ) මේ නියෝගවල සඳහන් කරනු ලබන සහතිකයක් සිතාමතාම වෙනස් කිරීම;

(ආ) මේ නියෝගවල සඳහන් කරනු ලබන සහතිකයක ආකාරයේ ව්‍යාජ සහතිකයක් සිතාමතාම සෑදීම;

(ඇ) මේ නියෝග මගින් නියම කරනු ලබන යම් සමීක්ෂණයක් සම්බන්ධයෙන් දැන දැනම හෝ නොසැලකිලිමත් කමින් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම;

(ඈ) මේ නියෝගවල සඳහන් කරනු ලබන සහතිකයක් යමෙකු රැවටීමේ අදහසින් භාවිත කිරීම, වෙනත් අයෙකුට තාවකාලිකව ලබා දීම හෝ තවකෙකු විසින් භාවිත කිරීමට ඉඩදීම; හෝ

(ඉ) (13) වන උපනියෝගය යටතේ භාරදීමට නියම කරනු ලබන සහතිකයක් භාරදීමට අපොහොසත් වීම,

සිදු නොකළ යුතු ය.

15. සහතික සහ උපකරණවල වාර්තා, සම්මුතියේ ඇමුණුමට අදාළ පරිශිෂ්ටයේ දී ඇති ආදර්ශයන්ට අනුරූප වන ආකෘතියෙන් සකස් කරනු ලැබිය යුතු ය.

16. සම්මුති සහතික නිකුත් කරනු ලැබ ඇති සෑම නෞකාවකම හිමිකරු සහ නෞකාධිපතිවරයා විසින් එම සහතික පරීක්ෂණය සඳහා සෑම අවස්ථාවක දී ම සූදානම් ව නැවේ තිබෙන බවට සහතික විය යුතු ය.

17. සම්මුතිය අදාළ වන රටක ආණ්ඩුවක අධිකාරය යටතේ නිකුත් කරනු ලබන සහතික, සම්මුතියෙන් ආවරණය වන සියලු කාර්යයන් සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළිගනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ-ජනරාල්වරයා, ඔවුන් විසින් නිකුත් කරනු ලබන සහතිකවලට සමාන බලයක් එම සහතිකවල පවතින බව සලකනු ලැබිය යුතු ය.

18. (1) යම් මුහුදු ගමනක් අතරතුර මගී නෞකා ආරක්ෂණ සහතිකයේ සඳහන් සමස්ථ සංඛ්‍යාවට වඩා අඩු තැනැත්තන් සංඛ්‍යාවක් ශ්‍රී ලාංකික නෞකාවක නෞකාස්ථව සිටින්නේ නම් සහ එහි ප්‍රතිඵලයක් ලෙස, සම්මුතියේ විධිවිධානවලට අනුකූලව, සහතිකයේ සඳහන් ජීවිතාරක්ෂක බෝට්ටු සහ වෙනත් ජීවිතාරක්ෂක උපකරණ ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් රැගෙන යාමට නිදහස තිබෙන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ පිළිගත් සංවිධානය විසින් ඇමුණුමක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උප නියෝගය යටතේ නිකුත් කරනු ලබන ඇමුණුම මගින්, සම්මුතියේ විධිවිධාන උල්ලංඝනය කිරීමක් සිදු නොවන බව සඳහන් කළ යුතු ය. එය සහතිකයට අමුණා තිබිය යුතු ය. එය නිකුත් කරනු ලැබ ඇත්තේ යම් විශේෂ මුහුදු ගමනක් සඳහා ද ඒ ගමන සඳහා පමණක් එය වලංගු විය යුතු ය.

19. (1) ශ්‍රී ලංකා වරායක රැඳී සිටින විදේශීය නැවක්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිසි අවසරය ලබා දෙන ලද නිලධරයන් විසින් පාලනය කිරීමට යටත් වන්නේ එම පාලනය, 12 වන නියෝගය හෝ 13 වන නියෝගය යටතේ නිකුත් කරනු ලබන සහතික වලංගු වන බවට සත්‍යායනය කිරීම සඳහා මෙහෙයවනු ලබන තාක් දුරට වේ.

(2) එකී සහතික වලංගු වන්නේ නම්, නෞකාව සහ එහි උපකරණවල තත්ත්වය එකී යම් සහතිකයක විස්තර සමග සාරානුකූලව අනුරූප නොවන බවට හෝ නෞකාව සහ එහි උපකරණ 11 වන නියෝගයේ (1) වන උපනියෝගයේ (අ) සහ (ආ) ඡේදවල විධිවිධානවලට අනුකූල නොවන බවට විශ්වාස කිරීම සඳහා පැහැදිලි හේතු නොපවතින්නේ නම් මිස, එම සහතික පිළිගනු ලැබිය යුතු ය.

(3) මේ නියෝගයේ (2) වන උප නියෝගයේ දී ඇති අවස්ථානුගත කරුණුවල දී හෝ යම් සහතිකයක් කල් ඉකුත් වී හෝ වලංගු වීම නතර වී ඇති අවස්ථාවක දී, නෞකාවට හෝ නෞකාස්ථ තැනැත්තන්ට අන්තරායක් නොවන පරිදි එයට මුහුදට යාත්‍රා කළ හැකි වන තෙක් හෝ උචිත අලුත්වැඩියා කිරීමේ ස්ථානයට නැව යාත්‍රා කිරීමේ කාර්යය සඳහා වරාය හැරයන තෙක් නෞකාව යාත්‍රා නොකරන බවට සහතික කිරීම සඳහා පාලනය පවත්වාගෙන යනු ලබන නිලධරයා විසින් පියවර ගනු ලැබිය යුතු ය.

(4) මේ නියෝගය යටතේ පාලනය ක්‍රියාත්මක කරනු ලබන විට, යම් නැවක් නොනිසි ආකාරයට රඳවා තබා ගැනීමෙන් හෝ ප්‍රමාද කිරීමෙන් වැළැක්වීම සඳහා ගත හැකි සියලු ප්‍රයත්න දැරිය යුතු ය. නැවක් එසේ නොනිසි ආකාරයට රඳවා තබාගන්නේ නම් හෝ ප්‍රමාද කරන්නේ නම්, ඉන් සිදුවන යම් පාඩුවක් හෝ හානියක් සඳහා වන්දි ලබා ගැනීමට හිමිකම් ලැබිය යුතු ය.

(5) මෙම පාලනය මගින් යම් ආකාරයේ මැදිහත්වීමක් ඇතිවන අවස්ථාවක දී, පාලනය පවත්වාගෙන යනු ලබන නිලධරයා විසින් වහාම, මැදිහත්වීමක් අවශ්‍ය යැයි සලකනු ලැබූ සියලු අවස්ථානුගත කරුණු සම්බන්ධයෙන් ලිඛිතව කොන්සල්වරයා වෙත දැනුම් දිය යුතු අතර ඔහු නොසිටින අවස්ථාවක දී, නෞකාවේ ධජය දැරීමට හිමිකම් ඇත්තේ කවර රාජ්‍යයක ද එම රාජ්‍යයේ සමීපතම රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයා වෙත දැනුම් දිය යුතු ය. ඊට අමතරව, සහතික නිකුත් කිරීම පිළිබඳ වගකිව යුතු නම් කරන ලද සමීක්ෂකවරු හෝ පිළිගත් සංවිධානවලට ද ඒ බව දැනුම් දිය යුතු ය. මැදිහත්වීම සම්බන්ධයෙන් වන කරුණු සංවිධානය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(6) (3) වන සහ (5) වන උප නියෝගවල නිශ්චිතව සඳහන් පරිදි ක්‍රියා කිරීමට නොහැකි වන්නේ නම් හෝ ඊළඟ නැවතුම් වරාය වෙත පිවිසීමට නැවට ඉඩ ලබා දී ඇත්නම්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, (5) වන උප නියෝගයේ සඳහන් පාර්ශවයන්ට අමතරව නැව සම්බන්ධයෙන් අදාළ සියලු තොරතුරු පිළිබඳ ඊළඟ නැවතුම් වරායේ අධිකාරයන්ට දැනුම් දිය යුතු ය.

(7) සම්මුතියේ XI - I වන පරිච්ඡේදයේ 4 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති වරාය රාජ්‍ය පාලනය හා සම්බන්ධ ක්‍රියාපටිපාටිය මේ නියෝගයට අදාළ විය යුතු ය.

20. යම් නැවකට උචිත වලංගු සහතික තිබේ නම් මිස, එම නැවට පක්ෂව සම්මුතියේ වරප්‍රසාද ඉල්ලා සිටිනු නොලැබිය හැකි ය.

## III වන කොටස

## හදිසි අනතුරු සහ විවිධ විධිවිධාන

21. (1) සම්මුතියේ XI - I වන පරිච්ඡේදයේ 6 වන නියෝගයේ විධිවිධානවලට අනුකූලව, යම් නැවකට සිදුවන යම් හදිසි අනතුරක් පිළිබඳ විමර්ශනයක් පැවැත්වීමට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බාරගනු ලැබිය යුතු ය.

(2) එවැනි විමර්ශනවල සොයාගැනීම් සම්බන්ධ අදාළ තොරතුරු සංවිධානය වෙත සැපයීමට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බාරගනු ලැබිය යුතු ය. එම තොරතුරු මත පදනම් වූ සංවිධානයේ කිසිදු වර්තාවක් හෝ නිර්දේශයක් මගින්, ඊට සම්බන්ධ නැව්වල අනන්‍යතාව හෝ ජාතිකත්වය හෙළිදරව් කිරීම නොකළ යුතු අතර, යම් නැවකට හෝ තැනැත්තකුට එහි වගකීම යම් ආකාරයකින් නියම කිරීම හෝ ඇඟවීම නොකළ යුතු ය.

22. යම් විශේෂ සවිකිරීමක්, අමුද්‍රව්‍යයක්, ආම්පන්නයක් හෝ මෙවලමක් හෝ එවැනි ආකාරයේ දෙයක් නෞකාවක සවිකළ යුතු බවට හෝ නෞකාවේ ගෙන යා යුතු බවට හෝ යම් විශේෂ සැපයීමක් සිදු කළ යුතු බවට සම්මුතිය මගින් නියම කරනු ලබන අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම නෞකාවේ වෙනත් යම් සවිකිරීමක්, අමුද්‍රව්‍යයක්, ආම්පන්නයක් හෝ මෙවලමක් හෝ එවැනි ආකාරයේ දෙයක් සවිකිරීමට හෝ ගෙන යාමට හෝ සිදු කළ යුතු වෙනත් යම් සැපයීමක් සිදු කිරීමට, එම සවි කිරීම, අමුද්‍රව්‍යය, ආම්පන්නය හෝ මෙවලම හෝ එවැනි ආකාරයේ දෙය හෝ සැපයීම අවම වශයෙන් සම්මුතිය මගින් නියම කර ඇති ආකාරයට ඵලදායී වන බව, පරීක්ෂණයක් මගින් හෝ අන්‍යාකාරයකින් සෑහීමකට පත් වන්නේ නම්, ඉඩ ලබා දිය හැකි ය.

23. ශ්‍රී ලංකාවේ පිහිටි යම් වරායක හෝ යම් ස්ථානයක ඇති යම් නෞකාවක් අනාරක්ෂිත නැවක් ලෙස හඳුනාගනු ලබන අවස්ථාවක දී, එනම් නෞකාවක නැව් බඳේ, උපකරණවල, යන්ත්‍ර සූත්‍රවල දෝෂ සහගත තත්ත්වයක්, සේවක පිරිස අඩු බව, අධිකව පැටවීම හෝ නුසුදුසු පැටවීමට හේතුවෙන් හෝ සම්මුතියයට අනුකූල නොවන වෙනත් යම් තත්ත්වයක් හේතුවෙන්, එකී නෞකාව සිදුකිරීමට අදහස් කරන සේවයේ ස්වභාවය අනුව, එයට මිනිස් ජීවිතවලට බරපතළ හානි සිදු නොකරමින් මුහුදට ගමන් කිරීමට නොහැකිවන යම් අවස්ථාවක දී, එහි දෝෂ සහගත තත්ත්වය සමීක්ෂණය කිරීමේ හෝ එම දෝෂය නිවැරදි කිරීමේ කාර්යය සඳහා එකී නෞකාව තාවකාලිකව රඳවා තබා ගනු ලැබිය හැකි ය.

24. සම්මුතියේ I වන පරිච්ඡේදයේ ඇති පාදක සටහන් සහ එම පාදක සටහන් මගින් සඳහන් කරනු ලබන යෝජනා, චක්‍රලේඛ, හෝ ලේඛන, මෙම නියෝගවල කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය.

25. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මේ නියෝගවල විධිවිධාන බලාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි, සම්මුතියේ සහ 1988 ප්‍රොටෝකෝලයේ විධිවිධානයන්හි අවම තාක්ෂණික ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියා කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් නිකුත් කරනු ලැබිය හැකි ය.

26. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර, වරදකරු කිරීමේ දී රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

27. මේ නියෝගවල-

"සාංවත්සරික දිනය" යන්නෙන්, අදාළ සහතිකයේ කල් ඉකුත්වන දිනයට අනුරූප වන්නා වූ එක් එක් අවුරුද්දේ දවස සහ මාසය අදහස් වේ;
"භාණ්ඩ නෞකා" යනුවෙන්, මගී නෞකාවක් නොවන ඕනෑම නෞකාවක් අදහස් වේ;
"මගී නෞකාව" යන්නෙන්, මගීන් දොළහකට වඩා වැඩි සංඛ්‍යාවක් රැගෙන යන නෞකාවක් අදහස් වේ;

EOG 01 - 0241

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.